ආදායමෙන් හැදුවේ. හැබැයි එක සැරේම නෙවෙයි. පියවරෙන් පියවර කෑල්ලෙන් කෑල්ල තමයි හදාගත්තේ. අරහේ සින්දුවක් ලියලා රෙකෝඩ් කරලා සල්ලි අරං එනකං මෙහෙ බාසුන්නැහේ බලාගෙන ඉන්නවා සිවිලිම ගහන්න. මම සීට් ගෙනාවේ නැත්නම් මිනිහා මාව සිවිලිමට තියලා ගහනවා.

**වැඩිපුරම ගීත ලිව්වේ කාටද ?**
ජෝතිට තමයි විශාල වශයෙන් ගීත ලිව්වේ. චිත්‍රපටිවලට. කැසට්වලට. කැසට්වලට ගීත ලියන-කොට ගීත දාසයම හොඳ වෙන්න එපායැ. සමහර ගීත ලිව්වේ පැරණි හින්දි නතුවලට. නින්ද නේන රාත්‍රියේ ගීතය අවුරුදු පනහක් පරණ තනුවකටයි ඒ කාලේ ලිව්වේ. මේ තනුවට ඊට කලින් ලියවුණ ගායනා කළ ගීතයක් තිබුණා. 'කවුරුන්ද මාගේ ආදරී අෑ කොයි පළාතේදෝ' කියලා. මුලින්ම ගීතයක් දෙකක් ලිව්වට පස්සේ ජෝති අයියා මචං ලෙවෙල් එකට වැටිලා හිටියේ. අපි බොහොම සුහද මිතුරන් වුණා. ජෝතිගේ ඉල්ලීමකට තමයි මේක ලිව්වේ. මට ආශ්‍රය කරන්න ලැබිච්ච පුද්ගලයන් අතරින් උත්තම ගණයේ පුද්ගලයෙක් ජෝති.

**චිත්‍රපටි ගීත ලියන්න යොමුවුණේ ?**
කේමදාස මාස්ටර් තමයි මට ඉස්සෙල්ලම චිත්‍රපටියකට ගීතයක් ලියන්න අවස්ථාව දුන්නේ. එයා තමයි සුනිල් ආරියරත්නට, ප්‍රේමකීර්තිට, කුලරත්න ආරියවංශට මට චිත්‍රපටිවලට ගීත ලියන්න අල්ලලා දුන්නේ. එයා බොහොම පරිත්‍යාගශීලී පුද්ගලයෙක්. කාගේ හරි දක්ෂකමක් දැක්කද අල්ලගත්තා ඒකට තැනක් දුන්නා. පංගුබේරුවක් මොකුත් නෑ. මගේ පළවෙනි චිත්‍රපට ගීතය ගායනා කළේ ලතා අක්කා. ලතා වල්පොල මගේ ගීතයක් ගායනා කරනවා කියන එක ඒ කාලේ මගේ හීනයක්වත් වෙලා තිබුණේ නෑ. 'පොකුරු පොකුරු මල් සැණකෙළි ඔමරි ලතාවයි' කියන ගීතය 'වාසනා' චිත්‍රපටියට මම මුලින්ම ලියපු ගීතය. කේ.ඒ.ඩබ්. පෙරේරා තමයි අධ්‍යක්ෂණය කළේ. හුගාක් චිත්‍රපපටිවල ගීත ලියන්න වෙන්නේ මෙලඩි එකට. ජවනිකාව මොකක්ද කියලා විස්තර කරලා ඒ වෙලාවේ සර්පිනාවෙන් මෙලඩි එක ගහනවා. ඒ වෙලාවෙම අපි ලියන්න ඕනේ. හරි අමාරුවෙන් ලිව්වා ඉතිං. මේකෙදි ජවනිකාව විස්තර කළේ ලමිස්සියකට ඉස්ඉස්සෙල්ලම ආදරේ රස දැනිලා මේක මෙයාට කියාගන්න බෑ. නමුත් විශාල සතුටකින් හිත පිරිලා. මේ සතුට පළකරන ගීතය ලියන්න කියලයි මට කිව්වේ. 'කවුරුන් හෝ මට කියන්න කණට කොදුරලා ආදරේද මේ දැනෙන්නේ සුවඳ ගල ගලා.'

**ලේඛක කටයුතුවල මේ විදිහට සාර්ථක වෙන්න මොනවගේ කරුණුද බලපෑවේ ?**
ඒ කාලේ අපේ පොඩි කල්ලියක් තිබුණා නුගේගොඩ අවට. සුනන්ද මහේන්ද්‍ර මම ආශෝක කොළඹගේ සනත් නන්දසිරි කරුණාරත්න අමරසිංහ ආනන්ද කේ විජේතුංග දයාරත්න රණතුංග කියන අපි කට්ටිය සතියකට දෙකකට වතාවක් නුගේගොඩ අවට කොහේ හරි තැනකදි හම්බවෙනවා. මේකෙන් අපි ඔවුනොවුන් පෝෂණය වුණා. සුනන්ද තමයි ඒකේ ලොක්කා. එතකොට එයා විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙක්. සුනන්දගේ මාර්ගයෙන් අපි ගියා මහාචාර්යා රතනකාරලගේ ගෙදරට. සුමානෙකට සැරයක් විතර එහෙ යනවා. එහෙට එනවා මානවසිංහ. එෆ් ආර් ජයසූරිය වගේ අය. ඒ අයගේ කතාවට කන්දීලා අපි පෝෂණය වෙනවා. අපිව මහලොකුවට සැළකුවේ නෑ. අපි පැත්තකට වෙලා ඒවාට සවන් දෙනවා. ඒවයින් තමයි අපි පෝෂණය වුණේ. ඒ අතරතුර පොත පත කියවනවා. එතකොට අපිට රස්සාවල් නෑනේ. අලුත් පොතක් පිටවුණාම දෙන්නෙක් සල්ලි දාල පොත අරගන්නවා.

**ඔබේ ගීත රචනා කිරීමේදී තමන්ගේම අත්දැකීම් යොදාගැණුන අවස්ථා මොනවද ?**
විවාහයට කලින් මගේ ලොකු ප්‍රේම සම්බන්ධයක් තිබුණා. මම ඒ කාන්තාවගේ වගතුග කියන්නේ නෑ.බොහෝ අය ඇය ගැන දන්න නිසා. එයාගෙයි මගෙයි ප්‍රේම සම්බන්ධය අවුරුදු දෙකහමාරක් විතර තිබුණා. ඒ නිසා තමයි මම අශෝකල ගෙදරින් අයින්වෙලා මරදානේ බෝඩිමකට ගියෙත්. එයා හිටියේ දෙමටගොඩ. එයා චරිතවත් ළමයෙක්. වල් ළමයෙක් නෙවෙයි. එයා හිටියේ දෙමටගොඩ ගෙවල් පේලියක. එයාට ඕනේ වුණේ විවාහය තුළින් නාගරික සුඛෝපභෝගී පරිසරයක ජීවත්වෙන්න යන්න. අපේ සම්බන්ධය යන අතරේ ඇය තක්සේරු කළා මම වගේ ගමේ මිනිහෙක් කසාද බැදගන ඒ සිහින ලෝකයට යන්න බෑ කියලා. ඒ නිසා පස්සේ එයා මාව විසිකරලා දැම්මා. ඒකෙන් මම විශාල මානසික පීඩාවකට පත්වුණා. හුගාක් දුක් වින්දා. මම පසුකාලෙක නවකතා පොතක් ලිව්වා සිහින කුමරු සහ ඕ තොමෝ කියලා. දයාරත්න රණසිංහ ගායනා කරන 'දුරස්වන්නට මේ ලෙසින්' මිල්ටන් මල්ලවාරච්චි ගායනා කළ 'මේ මැයි ගහ යට' ටී එම් ජයරත්න ගායනා කරන 'මේ අයුරින් අපි සංසාරේ' වගේ ගීත ගණනාවකටම මේ අත්දැකීම පාදක වුණා. අමරදේව ගයන 'සඳකඩ පහනේ රූ සිරි වරුණේ ගීතය'ත් මගේ අත්දැකීමක්. මම අනුරාධපුරේ ගියවෙලාවේ සඳකඩ පහන දැක්කම මම මවිතයට පත්වුණා. මේ ගල්පතුරක මිටියකින් කොහොමද මේ සිතුවම් නිර්මාණය කළේ කියලා. හරිම ලස්සන නිර්මාණයක් නේ. වික්ටර්ට ලියපු 'සිරිමා බෝ මැඩ මුණිදුන් වැඩහිඳ' ගීතය මම මගේ දුව වෙනුවෙන් ලියපු ගීතයක්.

**සාමාන්‍යයෙන් ගීතයක් රචනා කරන්න මොනවගේ පරිසරයක් ද වුවමනා වෙන්නේ ?**
ඒකට විශේෂ වෙලාවක්, ස්ථානයක් කියලා එහෙමම නෑ. නමුත් ගීතයක් ලියන්න ඕනේ වුණාම බොහෝ විට මම උදේම නැගිටලා කල්පනා කරනවා. මොකක්ද මේ සංකල්පනාව. මොන වගේ වචනද මේකට භාවිතා කරන්න ඕනේ කියලා. සංකල්පනාව අනුව තමන්ට එන අදහස් වලින් මොන කොටසද ගීතයට ගන්නේ කියලා තීරණය කරනවා. ඉස්සෙල්ල කොහොම හරි මුල් පද දෙක ඒකෙන් හරි ගස්සගන ඒ අනුව ඩිවලොප් කරනවා. ගීතයක් ලියන්න මේච්චර කාලයක් යනවා කියලා කියන්න බෑ. ඒකට යම් කාලයක් ගතවෙනවා. සමහර වෙලාවට දවසක් මදිවෙනවා.

**ඔබට ලැබුණ සම්මාන අල්මාරියක් පුරවලා තියනවා. කොච්චර විතර සම්මාන මේ වෙනකොට ලැබිලා තියනවද ?**
කොච්චර තියනවද කියල නම් මමවත් දන්නේ නෑ. හොදම ගීත රචකයා වශයෙන් මට ජනාධිපති සම්මාන තුන්පාරක්, සරසවි සම්මාන හතර පාරක්, ඕ සී අයි සී ප්‍රණාම සම්මානයක්, රාජ්‍ය සාහිත්‍ය සම්මානය, සුමති සම්මානය වගේ සම්මාන ගොඩක් ලැබිලා තියනවා. වසන්තයේ දවසක් චිත්‍රපටයේ අමරදේවයන් සහ සුනේත්‍රා සරත්චන්ද්‍ර ගයන ගීතයට ජනාධිපති සම්මානය තමයි මුලින්ම ලැබුණේ. ඕ සී අයි සී සම්මාන ගීත රචකයන්ට, ගායකයන්ට දෙන්නේ නෑ. සංගීත අධ්‍යක්ෂවරයාට විතරයි සම්මාන දෙන්නේ. ඒ අය කියන්නේ ගීතය කියන්නේ චිත්‍රපටියේ එන සුළු කොටසක් පමණයි. චිත්‍රපටිය පුරාම එය යන්නේ නෑ කියලා. ඒ නිසා හොදම සංගීත අධ්‍යක්ෂවරයාට විතරයි සම්මාන දෙන්නේ. හොඳම ගායකයාට දෙන්නෙත් නෑ. ගායිකාවට දෙන්නෙත් නෑ. ඒත් මට දුන්නා ප්‍රණාම සම්මානයක්.

**මෑත කාලයේ නව පරපුරේ ගායක ගායිකාවන-'ට ඔබ ලියුව ජනප්‍රිය වුණ ගීත මොනවද ?**
අලුත් ගායකයෝ එනවා ගීත ලියවගන්න. ආවම මම ලියලා දෙනවා. ඒ අයට ලියන්නෙත් අමරදේවට ලියනවා වගේම හොඳ ගීතයක් තමයි. ඒකට මම මුදලක් ගන්නවා. ඊට පස්සේ ඒ අය ඒක අරං ගිහිල්ලා ගායනා කරනවා. ඊට පස්සේ ඒකට මොනවා වෙනවද කියලා මම දන්නේ නෑ. ඩබ්ලිව් ඩී ආරියසිංහ කාලයක් සින්දු කිව්වට ජනප්‍රිය වුණේ නැති පුද්ගලයෙක්නේ. මෑතක මම එයාට ලිව්වා 'මා ළගටම තව ලංවෙලා' කියලා ගීතයක්. ඒක ජනප්‍රිය වුණා. එච්චරයි මෑත කාලයේ මතක.

**අජන්තා කිව්වම ඒක කාන්තාවන්ට තබන නමක් විදිහටයි අපි හඳුනගෙන තියෙන්නේ. ඇයි ඔබට එහෙම නමක් දීලා තියෙන්නේ ?**
පිරිමින්ටත් එහෙම නම් තියනවා. ඔය කාන්ති වක්වැල්ල කියලා ඉන්නේ. මගේ නම අජන්තා. ඒක මගේ දෙමව්පියෝ දාපු නම. ඒකට මොනව කරන්නද ? මට ඒ නම ගැන කිසිම ප්‍රශ්ණයක් නෑ. මම ඒ නමට බොහොම කැමතියි. කොච්චර ලස්සන නමක් ද අජන්තා රණසිංහ. මගේ යාලුවෝවත් කවදාවත් නම ගැන මගෙන් අහලා නෑ. ඒ කාලේ ලියුම් එවපු සමහර රසිකයෝ නම් කාන්තාවකට එවනවා වගේ ලියුම් එවපු අවස්ථා තියනවා. ඒවා ඉතිං බොහොම කලාතුරකින් වුණ දේවල්. මේ ළගදි දවසක ආචාර්ය අජන්තා පෙරේරා කියන පරිසරවේදිනිය මගෙන් ඇහුවා යූ හෑව් මයි නේම් නෝ කියලා. මම කිව්වා නෝ යූ හෑව් මයි නේම්. යු ආ යන්ගර්ස් ටු මී කියලා.

**ජීවිතේ දිහා ආපහු හැරිලා බලනකොට දැන් මොකද හිතෙන්නේ ?**
මේක පහසුවෙන් ආව ගමනක් නෙවෙයි. ඒ වුණාට ලක්ෂෙට කොඩි නොදැම්මට මට සෑහීමකට පත්වෙන්න පුළුවන්. මම කසාද බැන්දේ කෝකිල දේවි වීරතුංග මහත්මියගේ දුව. අපේ දරුවෝ දෙන්නම දැන් විවාහවෙලා වෙනම ජීවත්වෙන්නේ. ඒ දෙන්නම විධායක ශ්‍රේණියේ රස්සාවල් කරනවා. මටත් කරදරයක් නැතුව ජීවත්වෙන්ඩ තරම් ආදායමක් තියනවා. ණයක් නෑ. මට තව ජීවිතේ බලාපොරොත්තුවෙන්න තියෙන්නේ නිරෝග සම්පත විතරයි.


YSL

Migration

Services

ශ්‍රී ලාංකික ඔබට
සොඳුරු සේවය

We specialise in

General Skilled Migration Visas
Applications for State Migration Plans
Onshore|Offshore Partner Visas
Sponsored Visitor|Tourist Visas
Student Visas
Parent Visas

Lead Design House

Yashodhara Sarachchandra Liyanaarachchi
(Registered Migration Agent)
MARN: 0746956

0430 359 006

26 Sallybrook Circuit, Narre Warren, VIC 3805

Now also available for consultation at
Bundoora
(Close to Latrobe university , RMIT and NMIT)

6 Mat Rush Avenue, Bundoora, VIC 3083

Tel: 03 9467 4468

yasho@yslmigration.com

MIGRATION AGENT
REGISTERED
mara.com.au
REGISTRATION NUMBER 0746956

MIA
MEMBER OF MIGRATION INSTITUTE OF AUSTRALIA